පැමිණිලි අංක/HRC/925/2013 පැමිණිල්ලට අදාළව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් එවන ලද වාර්ථාව සම්බන්ධව අපගේ නිරීක්ෂණ මේ සමග එවමු.

අංක 01 ජේදය

අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් තනතුරු වශයෙන් පැවති සනීපාරක්ෂක කම්කරු, පාසල් කම්කරු, සාමාන්‍ය කම්කරු, කාර්යාල කම්කරු, උද්‍යාන කම්කරු, විද්‍යාගාර සේවක/ සහයක, පුස්තකාල සේවක/ සහයක, අරක්කැමි යන තනතුරු අහෝසි කරවීමක් සිදු නොකර ඇති බව සඳහන් කර එම වගන්තියේම අරක්කැමි තනතුර පමණක් ඉවත් කර ඉහත සඳහන් කර ඇති අනිකුත් තනතුරු සියල්ල ඒකාබද්ධ කර "පාසල් කාර්ය සහයක"තනතුරු නාමය සංශෝධනය කර ඇත. ඒකාබද්ධ කිරීම යනු තනතුරු සියල්ල ඒකරාශී කර එක් තනතුරක් ඇති කර තිබීමය. ජේදයේ හඳුන්වා දී ඇති කරුණු යට ගැසීමක් සිදුව ඇති බව මනාව පැහැදිලිය. වෘත්තීය සමිති නියෝජනයකින් තොරව කටයුතු කිරීම සේවකයින් හා පද්ධතියේ ගුණාත්මකභාවයට දැඩි හානි එල්ල වන මෙවැනි තීරණ සුදුසු නොවේ. වේ. ජේද 01 හි සඳහන් වගු පරිදි තනතුරු සියල්ල ඉවත් කොට "පාසල් කාර්ය සහයක" නමින් සඳහන් කිරීමෙන් පාසල් පද්ධතියේ කාර්ය නිසියාකාරව සිදු නොවන බව ඉතාමත් පැහැදිලිව කිව හැකිය.

අංක 02 ජේදය

මෙම ජේදය යටතේ අප සඳහන් කරන්නේ තනතුරු සියල්ල ඒකාබද්ධ කිරීම තුලින් සනීපාරක්ෂක කම්කරු, පාසල් කම්කරු, කාර්යාල කම්කරු, වතු කම්කරු, පුස්තකාල සේවක, රසායනාගාර සේවක, ආදී සියළුම රාජකාරී එක් සේවකයෙකු සිදුකළ යුතුයි. සනීපාරක්ෂක තනතුර සඳහා බඳවා ගන්නා අධ්‍යාපන සුදුසුකම් හා රාජකාරිය සම්පූර්ණයෙන්ම අනිකුත් තනතුරු වල ස්වාභාවය අනුව වෙනස්ය. රසායනාගාර, පුස්තකාල රාජකාරින් සඳහා බඳවා ගන්නා සේවකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් එක සමාන නොවේ. එබැවින් ආයතන තුළ ගැටළු මෙන්ම සේවකයින් අතර නොසන්සුන්තාවය මෙන්ම පාසල් පරිපාලනයට මහත් ගැටළුවක්, සේවකයින්ට රාජකාරී පැවරීමේ දී සිදුවන බව ඉතාමත් පැහැදිලිව සඳහන් කරමු.

අංක 2. 01 ජේදය

එහි සඳහන් පරිදි සේවකයින් මූලික අයිතීන් අහෝසි වීම පිළිගෙන නොමැති බවත් තනතුරු ඒකාබද්ධ කර එක් තනතුරක් ඇති කිරීමෙන් මූලික අයිතීන් උල්ලංඝණය වී නොමැත්තේ කෙසේද යන්නත් පාසල් පරිපාලනයට එක් තනතුරකින් සියළු කාර්යන් ඉටු කර ගැනීම කිසිසේත් සිදු කළ නොහැක. පුස්තකාල සඳහා අනිවාර්යෙන් පුස්තකාල සේවකයෙකු රැඳී සිටිය යුතු බවද රසායනාගාර තුළ රසායනාගාර සේවකයින් රැඳී සිටිය යුතු බවද සේවකයින් නොමැතිව සිදුව ඇති අනතුරු සම්බන්ධව අප වෙත වාර්තා වූ කරුණු රාශියක් ඇත. සනීපාරක්ෂක සේවකයාගේ කාර්‍යයන් පාසල් වැසිකිළි, කැසිකිළි නියමිත පරිදි ළමුන්ට හොඳ යහපත් සනීපාරක්ෂක ක්‍රියාවලියක් සිදුවීම සඳහා අවශ්‍ය නිසි ක්‍රියාවලියක් සිදුවිය යුතුයි.

එසේ නොමැතිව රජයේ අනෙකුත් කාර්යාල හා සන්සංධනාත්මකව පාසල් මැන බැලීම ප්‍රායෝගික නොවන බවද දැඩි ලෙස සිහිපත් කරමු.

අංක 02. 02 ඡේදය

තනතුරු කිහිපයක් ඒකරාශි කර තිබීම මගින් එක් එක් තනතුර සඳහා බඳවා ගත් අධ්‍යාපන සුදුසුකම් ගැටළු ඇතිවන බවත් තනතුරු වල කාර්යන් සම්බන්ධ ගැටළු ඇති වන බැවින් පිළිගත නොහැක.

අංක 02. 03 ඡේදය

පුස්තකාලාධිපති සේවාව සඳහා සීමිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමේ දී පුස්තකාල සේවක/ සහයක තනතුරක වසර 10 සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. එසේ නම් පුස්තකාල සේවක තනතුරක් "පාසල් කාර්ය සහයක" තනතුරට ඒකාබද්ධ කර එක් තනතුරක් ඇති කිරීමත් පුස්තකාලාධිපති තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව රාජ්‍ය සේවකයින් වශයෙන් ඇහිරී ඇත.

අංක 02. 04 ඡේදය

එක් එක් පළාත් සභා සඳහා එක් එක් තනතුරු සඳහා 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පෙර බඳවා ගත් ක්‍රමවේදය වෙනස් වේ. කම්කරු ආරම්භක වැටුප් පියවරෙන් සනීපාරක්ෂක කම්කරු වැටුප් වර්ධක 2 ක් වැඩිපුර ගෙවීමෙනුත් පුස්තකාල සේවක, රසායනාගාර සේවක වැටුප් වර්ධක 03ක් වැඩිපුර ගෙවීමෙන් බඳවා ගැනීම් සිදුවුණි. තවද 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් ඇතැම් පළාත් සභා සඳහා PL 1 යටතේ බඳවා ගැනීම් වූයේ ආරම්භක වැටුප් පියවරේ සනීපාරක්ෂක කම්කරු, පාසල් කම්කරු යන තනතුරුය. පුස්තකාල සේවක/ රසායනාගාර සේවක/ සහයක, යන තනතුරු සඳහා දැනට සේවයේ නියුතු සේවකයින්ගේ අධ්‍යාපනික සුදුසුකම් මත බඳවා ගැනීම් සිදු කෙරිනි. එහෙත් මෙම ක්‍රියාවලිය තුලින් රේඛීය අමාත්‍යාංශය හා පළාත් සභා අතර බරපතළ වැටුප් හා තනතුරු විෂමතාවයක් නිර්මාණය වී ඇත.

අන්‍යසතු කිරීම සපුරා තහනම්

අංක 02. 05 ඡේදය

PL 1 ආරම්භක වැටුප් බාණ්ඩයේ තනතුරු සියල්ල ඒකාබද්ධ කිරීම තුලින් එවැනි සළකා බැලීමක් සිදු කිරීමත් අපහසුය.

අංක 02. 06 ඡේදය

පාසල් සඳහා පත්වීම් පිරිනමනු ලබන්නේ දේශපාලන හිතවත්කම් මත දේශපාලන ලැයිස්තු මතයි. එම නිසා ආයතන ප්‍රධානියා දේශපාලන තර්ජන ගර්ජන මැද්දේ රාජකාරි පැවරීම ඉතා දුෂ්කරතාවයට පත්ව ඇත. එබැවින් ජ්‍යෙෂ්ඨ සේවකයින් සිටිය දී දේශපාලන ලැයිස්තු මත පැමිණි නවක සේවකයින්ගේ දේශපාලන බළපෑම් මත නිසි තනතුරේ පිහිටු වීමට නොහැකි වීමෙන් විදුහලේ පහළ තනතුරු වල

රාජකාරි ඉටුකර ගත නොහැකි වේ. එම නිසා නිශ්චිත තනතුරක් නොමැති වීමෙන් පාසල් ප්‍රධානියාට බරපතළ ගැටළු වලට මුහුණ පෑමට සිදු වේ.

02. 07 ඡේදය

අතීතයේ පත්වීම් ලැබූ සේවකයින් හා වර්තමානයේ පත්වීම් ලබන සේවකයින් අතර මෙම බඳවා ගැනීම් පටිපාටි නිසා දැඩි ව්‍යාකූලතා ඇති වේ.

02.08 ඡේදය


අප විසින් හා පළාත් මට්ටමින් දැනටමත් කළමණාකරණ දෙපාර්තමේන්තුවට යෝජනා ඉදිරිපත් කර ඇත.

කාර්යාලයකට වඩා පාසල් පද්ධතිය කෙරෙහි මෙයට වඩා යහපත් අයුරකින් සිතා කටයුතු කිරීම ඉතා උචිත බවත් කාර්යාලයන්හි කුඩා දරුවන් නොමැති බවත් පාසල් පද්ධතියේ නොතේරෙන වැඩෙන එක් එක් අවධියේ දරුවන් සිටින බැවින් ඔවුන්ට ගුණාත්මක පාසල් පද්ධතියක් ඇති කර ලීමත් සනීපාරක්ෂක පද්ධතිය ඉතා ඉහළ මට්ටමක පවත්වා ගෙන යෑමත් පාසල්, පුස්තකාල, කාර්යාල, පරිඝණක ඒකක, විද්‍යාගාර ආදී ක්‍රමවත් ආකාරයෙන් කුඩා හා සම වයසේ දරුවන්ගෙන් ආරක්ෂා කිරීම හා පිරිසිදු භාවය තබා ගැනීමත් සිසුන්ගේ අධ්‍යාපන රටාව මනාව පවත්වාගෙන හොද මානසිකත්වයකින් අධ්‍යාපනය හැදෑරීමටත් තරගකාරීත්වය මත ගෙන යනු ලබන අධ්‍යාපන ක්‍රම වේදයට දරුවා හුරු කරවීම සඳහා පාසල් පද්ධතියට එක් එක් තනතුරු සඳහා සේවකයින්ගේ අවශ්‍යතාවය දැඩි ලෙස පෙන්වා දෙමු.

අන්සතු කිරීම සපුරා තහනම්

අනිකුත් කාර්යාල හා සසදා පාසල් පද්ධතියට සමාන කර නොගන්නා ලෙසද ඉතා ඕනැකමින් ඉල්ලා සිටින අතර තනතුරු ඒකාබද්ධ කිරීමට තීරණය කිරීම සම්බන්ධව අපගේ විරෝධය දැඩි ලෙස ප්‍රකාශ කරමු.

ස්තුතියි



අජිත් කේ. තිලකරත්න
ප්‍රධාන ලේකම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ, මහනුවර.
ලි.ප. අංකය 6727

මෙයට විශ්වාසී,
අජිත් කේ තිලකරත්න,
ප්‍රධාන ලේකම්,
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය.